# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2017 නොවැම්බර් මස 07 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය දේශීයවෛද්‍ය, සමාජ සුභ සාධන,පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017/10/17 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/17/98)

(අ) කොළඹ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ජීව වෛද්‍ය ඉංජිනේරු ධයනා කෞෂිනී ආරියදාස යන අය ආයතනයේ පැමිණීමේ හා පිටවීමේ ලේඛණයේ අත්සන් නොකර 2004 සිට වැටුප් ලබා ගන්නා බව දන්නේද?

(ආ) එම කාර්යාලයට අයත් රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හා අනෙකුත් ආයතන වලට අනවශ්‍ය අතිරික්ත වෛද්‍ය උපකරණ සහ නිසි ප්‍රමිතියකින් තොර උපකරණ ඇයගේ සහය ඇතිව මිලදී ගන්නා බව විගණකාධිපති විසින් අනාවරණය කරගෙන ඇති බව පිළිගන්නේද? ඒ සම්බන්ධව ගත් පියවර කුමක්ද?

(ඇ)

I. ජීව විද්‍යා ඉංජිනේරු ඒකකයට ලබා දී ඇති PE 6817 කැබ් රථය ඇයගේ පෞද්ගලික කාර්යයන් සඳහා යොදා ගෙන අවභාවිතා කරන බව දන්නවාද? ඒ සම්බන්ධව ගත් පියවර කුමක්ද?

II. ජීව වෛද්‍ය උපකරණ සැපයුම් ආයතනයකින් අල්ලස් වශයෙන් විදේශ සංචාරයක් ලබා දී ඇති බවත්, එය විගණන වාර්තාවේ සඳහන්ව ඇති බවත් දන්නවාද? ඒ සම්බන්ධව ගත් පියවර කුමක්ද?

III. මෙකී සංචාරය ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව 2014.08.28 සිට 2014.09.03 කාලසීමාව තුල සිදු කර ඇති බව දන්නේද?

IV. මේ සම්බන්ධව ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද?

(ඈ) නොඑසේ නම් මන්ද?

2. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017/10/17 දින අසන ලද ප්‍රශ්නය; ( ප්‍ර/vi(1)/17/99)

(අ) 2017 පෙබරවාරි මස 07 වැනි දින හා අංක ආමප/17/0105/742 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විදුහල්පතිවරුන් සඳහා මෙතෙක් ගෙවනු ලැබූ දීමනාව සංශෝධනය කර ඇති බව ඔබතුමා දන්නේද?

(ආ) ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අත්සනින් 2017.03.14 දින හා 16/2017 දරණ චක්‍රලේඛනයක් නිකුත් කර ඇති බව ඔබතුමා දන්නේද?

(ඇ) එම චක්‍රලේඛනයට අනුව 2017 මාර්තු මස සිට සංශෝධිත දීමනාව ගෙවිය යුතු බව ඔබතුමා දන්නේද?

(ඈ) චක්‍රලේඛනය නිකුත් කර මාස 07 ක් පමණ ගෙවී ගියද එම දීමනාව මෙ දක්වා නොගෙවන්නේ කුමන හේතුවක් නිසාද?

(ඉ) එය හිඟ දීමනා සමඟ ගෙවන්නේ කවදාද?

3. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017/10/17 දින අසන ලද ප්‍රශ්නය, ( ප්‍ර/vi(1)/17/101)

(අ) බ/ප/ මීගමු අධ්‍යාපන කලාපයේ ජාතික පාසල් ගණන සහ බස්නාහිර පළාත් පාසල් ගණන කීයද?

(ආ) මෙම පාසල් අතරින් මෙවර සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අනුව බස්නාහිර පළාත් පාසල් වල අ.පො.ස (සා.පෙළ) සමත් ප්‍රතිශතය කුමක්ද? ජාතික පාසල් වල සමත් ප්‍රතිශතය කුමක්ද?

(ඇ) දිවයින පුරා මෙවර අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල හා සංසන්දනය කිරීමේදී බස්නාහිර පළාත කුමන ස්ථානයක සිටින්නේද?

(ඈ) පෙර වර්ෂවල් හා සසඳන කල මෙවර අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල බස්නාහිර පළාතේ අඩුවී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

(ඉ) මේ සම්බන්ධයෙන් වහා අවධානය යොමු කර පළාතේ පළාත් පාසල් ප්‍රතිඵල ඉහළ නැංවීමට ඔබතුමා පියවර ගන්නේද?

(ඊ) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙතින් මේ පිළිබඳව කරුණු විමසන්නේද?

(උ) නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු සුනිල් ජයමිණි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, ( ප/vi(1)/17/102)

අ. 2017.05.15 දින මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ බස්නාහිර පළාත් සභාවට කොපමණ වාහන ප්‍රමාණයක් මාසික කුලී පදනම මත ලබා ගත්තේද?

ආ. මෙම වාහන වෙන් වෙන්ව ඩබල් කැබ්, මෝටර් කාර්, වෑන් වශයෙන් සඳහන් කළ හැකිද?

ඇ. එක් එක් වාහනයක මාසික කුලිය කොපමණද?

ඈ. මෙම වාහන ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කළේද?

ඉ. ඉදිරිපත් වූ ආයතන ගණන කීයද?

ඊ. ටෙන්ඩරය හිමි වූ ආයතනයේ නම, ලිපිනය කුමක්ද?

උ. ටෙන්ඩරය හිමි වූ ආයතනයේ, සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නම් මෙම සභාවට හෙළි කළ හැකිද?

ඌ. වාහන සඳහා රියදුරු, ඉන්ධන හා සුළු නඩත්තු කටයුතු පළාත් සභාව විසින් ලබා දිය යුතු බව දන්නවාද?

එ. ගිවිසුම් අනුව මෙම වාහන වසර 05 කින් මුල් අයිතිකරු වෙත නැවත භාර දිය යුතු බව දන්නවාද?

ඒ. දළ වශයෙන් මෙම වාහන මුල් අයිතිකරු වෙත භාර දෙන විට වසර 05 කින් කෝටි 19 ක අධික මුදලක් සමාගමට ගෙවීමෙන් පසු පළාත් සභාවට කෝටි 10 ක පමණ පාඩුවක් සිදු වන බව පිළිගන්නවාද?

ඔ. මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන්නේද?

ඕ. නොඑසේනම් ඒ මන්ද?

5. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, ( ප/vi(1)/17/103)

අ. බස්නාහිර පළාත තුළ ලියාපදිංචි හා/හෝ ඉන් පරිබාහිරව ඇති සමස්ථ ත්‍රීරෝද රථ ප්‍රමාණය පිළිබඳ සංගණනයක් තිබේද? එසේ නම් එහි ප්‍රමාණය කුමක්ද?

ආ. බස්නාහිර පළාත තුළ ඇති ත්‍රීරෝද රථ ප්‍රමාණය කීයද? නැතහොත් දළ වශයෙන් කීයද?

ඇ. 2017 වසරේ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ත්‍රීරෝද රථ ලියාපදිංචිය / නියාමනය හා/හෝ වෙනත් කටයුතු සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කර තිබේද?

ඇ. උක්ත ගැසට් නිවේදනයට අනුව ත්‍රීරෝද රථ ලියාපදිංචිය / නියාමනය පොලිසියට පවරා ඇත්ද?

ඉ. එවැනි ලියාපදිංචියක් සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල නැතහොත් පළාත් පාලන ආයතන තිබියදී ඉහත (ඇ) හි ඇතුලත් කරුණු සඳහා පොලිසිවලට යොමු කිරීම වැරදි පූර්වාදර්ශයක් බව ඔබතුමා පිළිගන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

**6. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,** (ප්‍ර/vi(1)/17/104)

අ. බස්නාහිර පළාත තුල ත්‍රීරෝද රථ මාර්ග ප්‍රවාහන කර්මාන්තයේ නියුතු රියදුරන් හා හිමිකරුවන් මුහුණ දෙන ගැටළු විසදීම සඳහා 2002 අංක 06 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ ප්‍රඥප්තිය සම්මත කර ගත්තද, ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු වී නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. නිසි අධ්‍යනයකින් තොරවීමත්, නිසියකාර නියාමනයක් සිදු නොවීමත් හේතුවෙන් ත්‍රීරෝද රථ කර්මාන්තය සමාජ ප්‍රශ්නයක් බවට පත්වී ඇති බව ඔබතුමා පිළිගන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

ඇ. ත්‍රීරෝද රථ නියාමනයට අවශ්‍ය කරන නීති රීති වල අඩුවක් පවතින බව ඔබතුමා පිළිගන්නේද?

ඈ. එකී අඩුව සම්පූර්ණ කරනු වස් ත්‍රීරෝද රථ නියාමනය සඳහා බස්නාහිර පළාත තුල නිශ්චිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරනු ලබන මාර්ගෝපදේශය ලබා දීමට නියාමන ආයතනයක් පිහිටුවනවාද? නොඑසේ නම් ඒ මන්ද?

**7. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,** (ප්‍ර/vi(1)/17/105)

අ. i. බියගම ප්‍රාදේශීය සභාව විසින් පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ මාවරමණ්ඩිය පොදු ඉඩමේ ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ල සඳහා කොපමණ මුදලක් වැය කර ඇත්ද?

ii. පළාත් පාලන අමාත්‍යාංශය මේ සඳහා කොපමණ මුදලක් වැය කර ඇත්ද?

iii. බියගම ප්‍රාදේශීය සභා අරමුදලින් මේ සඳහා කොපමණ මුදලක් වැයකර ඇත්ද?

ආ. i. බියගම ප්‍රාදේශීය සභාවට අයත් මාකොල බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා මේ වන විට කොපමණ මුදලක් වැය කර ඇත්ද?

ii. පළාත් සභාවෙන් මෙම ගොඩනැගිල්ල සඳහා කොපමණ මුදලක් වැය කර ඇත්ද?

iii. ප්‍රාදේශීය සභාවෙන් මෙම ගොඩනැගිල්ල සඳහා කොපමණ මුදලක් වැය කර ඇත්ද?

8. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,
( ප/vi(1)/17/106)

අ. i. බියගම මැතිවරණ කොට්ඨාශයේ පළාත් සභා මාර්ග කීයක් තිබේද?

ii. එම මාර්ග මොනවාද?

iii. එම මාර්ග සංවර්ධනය කිරීමට 2016/2017 වර්ෂ වල මුදල් වෙන් කර ඇත්ද?

iv. එම මුදල කොපමණද?

ආ. i. දරණගම වෙළදාම්පිට මාර්ගයේ පාලමක් සෑදීමට මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත්ද?

ii. එම මුදල කොපමණද?

iii. එම පාලම කොපමණ කලකින් අවසන් කල හැකිද?

9. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,
( ප/vi(1)/17/107)

අ. කැළණිය අධ්‍යාපන කලාපයේ මුළු පාසල් ප්‍රමාණය කොපමණද?

ආ. එහි තිබෙන පළාත් පාසල් සංඛ්‍යාව කොපමණද?

ඇ. මෙම කලාපය තුල 2017 වර්ෂයේ පළාත් පාසල් වලින් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි දරුවන් සංඛ්‍යාව කොපමණද?

ඈ. සමත් සංඛ්‍යාව කොපමණද?

ඉ. අසමත් සංඛ්‍යාව කොපමණද?

ඊ. සමත් අසමත් සංඛ්‍යාව ප්‍රතිශත වශයෙන් කොපමණද?

උ. මෙම විභාගයේ ලකුණු 70 ට වඩා වැඩියෙන් ලබා ගත් දරුවන් සංඛ්‍යාව කොපමණද?

ඌ. ලකුණු 70 ට අඩු දරුවන් සංඛ්‍යාව කොපමණද?

එ. බියගම අධ්‍යාපන කොට්ඨාශයේ 2017 ශිෂ්‍යත්ව ප්‍රතිඵල අනුව 1,2,3 ස්ථාන ගත් පාසල් මොනවාද?

ඒ. බියගම අධ්‍යාපන කොට්ඨාශයේ සියලු පාසල් වල ශිෂ්‍යත්ව ප්‍රතිඵල කෙසේද?

10. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, ( පු/vi(1)/17/108)

අ. බස්නාහිර පළාත් සභාවේ සංවර්ධන නිලධාරින් ලෙස පත්වීම් ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පළාත් සභා සංවර්ධන කටයුතුවල නිරත වන සංවර්ධන නිලධාරීන් සඳහා නිවාඩු දිනවල සේවය කිරීමේදී දීමනාවක් ලබාදුන් බව ඔබතුමා පිළිගන්නේද?

ආ. මේ වන විට එකී දීමනාව සමහර ආයතනවල කප්පාදු කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඇ. යතුරුපැදි ලබාදුන් බව පවසා එකී දීමනාව කප්පාදු කිරීම ඔබතුමා අනුමත කරන්නේද?

ඈ. එසේ නිවාඩු දියන්හි විශාල සේවයක් කරන සංවර්ධන නිලධාරීන් සඳහා එකී දීමනාව නැවත ලබාදීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?

ඉ. නොඑසේ නම් මන්ද?

11. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, ( පු/vi(1)/17/109)

අ. බස්නාහිර පළාත් සභාවේ සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලද නිලධාරීන් සඳහා රු. 500/- ක දුරකථන දීමනාවක් ලබාදීමට කටයුතු කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. එසේ දුරකතන දීමනාව සමහර ආයතනවල නිලධාරීන් සඳහා මේවන විටත් ලබා දී නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

ඇ. ඔවුන් සේවය කරනු ලබන ආයතනවල ප්‍රධානීන් සේවා ස්ථානයේ දුරකතනවලින් ඇමතුම් එකී නිලධාරීන්ට ලබා නොදෙන බැවින් එම දීමනාව ලබාදීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න සභාවට දන්වන්නේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

12. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/vi(1)/17/110)

අ. කටාන ප්‍රා.ලේ. කොට්ඨාශය තුල ක්‍රියාත්මක ග්‍රාම සංවර්ධන සමිති ගණන කීයද?

ආ. කටාන ප්‍රා.ලේ. කොට්ඨාශයේ අංක 67 උඩංගාව ග්‍රාම නිළධාරි වසමේ ග්‍රාම සංවර්ධන සමිතියේ 2017 වසරට අදාල නිලතල අනුව නිලධාරීන්ගේ නම් ලිපිනයන් වෙන් වෙන් වශයෙන් සභාගත කල හැකිද?

ඇ. මෙම වසරද ඇතුලත්ව පසුගිය වසර 5 ක කාලය සඳහා මෙම සමිතිය මගින් ක්‍රියාත්මක කර ඇති රජයේ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද?

ඈ. එකී ව්‍යාපෘති සංඛ්‍යාව අනුව සියයට පහ බැගින් (5%) සමිතිය වෙත රැස්කරගත් මුළු මුදල කොපමණද?

ඉ. වර්ෂ 2012 සිට වර්ෂ 2016 දක්වා මෙම සමිතිය මගින් ගමේ සංවර්ධනය වෙනුවෙන් කර ඇති සේවාවන් මොනවාද?

ඊ. එකී සමිතියේ 2016,2015,2014,2013,2012 සඳහා වන වාර්ෂික වාර්තාවන් සහ වාර්ෂික අයවැය වාර්තාවන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

13. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/vi(1)/17/111)

අ. කටාන ප්‍රා.ලේ. කොට්ඨාශයේ අංක 71 තිඹිරිගස්කටුව ග්‍රාම නිළධාරි වසමේ ග්‍රාම සංවර්ධන සමිතියේ 2017 වසරට අදාල නිලතල අනුව නිලධාරීන්ගේ නම් ලිපිනයන් වෙන් වෙන් වශයෙන් සභාගත කල හැකිද?

ආ. මෙම වසරද ඇතුලත්ව පසුගිය වසර 5 ක කාලය සඳහා මෙම සමිතිය මගින් ක්‍රියාත්මක කර ඇති රජයේ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද?

ඇ. එකී ව්‍යාපෘති සංඛ්‍යාව අනුව සියයට පහ බැගින් (5%) සමිතිය වෙත රැස්කරගත් මුළු මුදල කොපමණද?

ඈ. වර්ෂ 2012 සිට වර්ෂ 2016 දක්වා මෙම සමිතිය මගින් ගමේ සංවර්ධනය වෙනුවෙන් කර ඇති සේවාවන් මොනවාද?

ඉ. එකී සමිතියේ 2016,2015,2014,2013,2012 සඳහා වන වාර්ෂික වාර්තාවන් සහ වාර්ෂික අයවැය වාර්තාවන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :-

"2017.10.19 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එකඟතාවය පළ කල පරිදි අද දින (2017.11.07 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2017.11.14 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර, එම අතිරේක රැස්වීම් දිනය, (2017.11.14දිනය.) 'බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්යය පටිපාටි රීති සංග්‍රහය' අනුමත කිරීම සඳහා වෙන් කළ දිනය' විය යුතුය."

X. පොදු කටයුතු

01. ගරු සුමිත්ලාල් මෙන්ඩිස් - සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටුයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)

යෝජනාව :

'පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම පද්ධතිය'
(කෙටුම්පත)

"පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම පද්ධතිය - කෙටුම්පත, රජයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එය පළාත් සභාවල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස, රජයේ අමාත්‍ය මණ්ඩලයෙන් උපදෙස් ලැබී ඇති බවත්, ඒ අනුව එම 'ආචාර ධර්ම පද්ධතිය - කෙටුම්පත', මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කර අදාළ අනුමැතිය සමඟ නැවත රජයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත එවන මෙන් දන්වා, එම ලේකම් විසින් එවා තිබූ අංක PL/10G/08/15 දරණ හා 2017.05.27 දිනැති ලිපිය සම්බන්ධව, 2017.06.21 දින පැවති, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කර එළඹුනු තීරණයට අනුව, එම 'ආචාර ධර්ම පද්ධතිය - කෙටුම්පත' බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව, වැඩිදුර තීරණයක් ගැනීමට 2017.09.20 දින පැවති, බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, එදින හා 2017.09.27 දින පැවති එම බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එම ආචාර ධර්ම පද්ධතිය - කෙටුම්පත මෙම පළාත් සභාවට ඉදිරිපත් කර පළාත් සභාවේ එකඟතාවය ලබා ගෙන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට අනුමැතිය ලද හෙයින් හා

එකී ආචාර ධර්ම පද්ධතිය - කෙටුම්පත, 2017.10.17 දින මෙම පළාත් සභාවට පිළිගන්වන ලදින්, එම කෙටුම්පත පිළිබඳව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේදී සාකච්ඡා කර, මෙම පළාත් සභාව විසින් එළඹෙන තීරණයන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා යැවිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

[කෙටුම්පත 2017.10.17 දිනට අදාල සභා න්‍යාය පත්‍රය සමඟ සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලබෙන්නට සලස්වා ඇත.]

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01.** ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා:

"බෞද්ධ සිද්ධස්ථාන කේන්ද්‍ර කර ගනිමින් පවතින එහෙත් වියැකී යන පාරම්පරික සංස්කෘතිකාංගයන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පවත්වනු ලබන පෙරහැරවල් සඳහා අලි ඇතුන් අවශ්‍යද යන්න ගරුතර මහා සංඝරත්නයෙන් සහ ඒ ඒ පෙරහැර කමිටු වලින් විමසා ඒ සඳහා අවශ්‍ය අලි ඇතුන් සපයා දීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි.

(යෝ/vi(1)/17/07)

**02.** ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාතේ කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක 2 ට අයත් ප්‍රදේශයක පිහිටා ඇති බොල්ගොඩ ගඟ ලෙසත් වැව ලෙසත් හඳුනන තෙත් බිම් පද්ධතිය පළාතේ සංවර්ධනයට යොදා ගත හැකි වටිනා සම්පතකි. ආර්ථික හා පාරිසරික වටිනාකමක් ඇති මෙම තෙත් බිම් පද්ධතිය වර්තමානය වන විට නොයෙක් විනාශයන්ට ගොදුරු වූ මානව සංවර්ධනයට සම්බන්ධ නොවන කිසිදු පරිපාලන ආයතනයක ඍජු සංවර්ධනයකට ආයක නොවුනු අත්හැර දමන ලද සම්පතක් බවට පත් වී ඇත. මිරිදිය ධීවර කර්මාන්තය, පළාත් සංචාරක ව්‍යාපාරය, භාණ්ඩ ප්‍රවාහනය, තෙත් බිම් ආශ්‍රිත ඖෂධීය හා කෘෂි ආර්ථික තත්ත්වයන් පෝෂණය කර ගැනීම යනාදි වටිනා සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි මෙම පරිසර පද්ධතිය පිළිබඳව පුළුල් විද්‍යාත්මක සමීක්ෂණයකින් පසුව පරිපාලන ආයතන ඒකාබද්ධ කරගත් බොල්ගොඩ තෙත් බිම් පද්ධතිය උදෙසා සංවර්ධන වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි."

(යෝ/vi(1)/17/08)

## XII. සභාව කල් තැබීම.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2017.10.19 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පරියන්තය,
සෙත්සිරිපාය,